**ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1. **තත්වාගණනය කල මතය**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 **ජූලි** 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 **ජනවාරි 26 දින** ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන **ලදී .** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් **2019** දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. **තත්වාගණනය කල මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ අංක 1.6.4 (අ), 1.6.5 හා 1.6.6 (අ) (ඇ) (iii) යන ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කිරිමේදි වෙනත් ලැබීම් සහ වෙනත් ගෙවීම් යටතේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සහ ගුරු වැන්දඹු අනත්දරු අරමුදල යන අරමුදල් දෙක යටතේ වර්ෂය තුළ එකතු කරන ලද ආදායම් රු.43,437,572,432 ක් සහ වර්ෂය තුළ ගෙවීම් රු.43,255,697,553 ක්ද ඇතුළත් කර තිබුණි. එසේ වුවද මෙම අරමුදල් දෙක සඳහා වෙන වෙනම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. | ගුරු වැන්දඹු අනත්දරු අරමුදලට අදාළ පනත් සංශෝධනය කිරීම හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල 253 ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කිරීම වෙනුවට වෙනම අරමුදලක් ලෙස ක්‍රියාත්මක කිරීම කළ යුතු වීම. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 07/2006 අනුව මහා භාණ්ඩාගාරය විසින් පත් කල විශේෂ කමිටුවකින් අරමුදලට අදාළ පනත් සංශෝධනය කර වසා දැමීමට යෝජනා කර තිබුනද මෙතෙක් අවසන් තීරණයක් ලබා දී නොමැත. මේ නිසා මෙම අරමුදල් දෙක යටතේ වර්ෂය තුළ එකතු කරන ලද ආදායම් සහ වර්ෂය තුළ කරන ලද ගෙවීම් වෙනත් ලැබීම් සහ වෙනත් ගෙවීම් යටතේ ඇතුළත් කර ඇත. |

**1.6.2. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** වර්ෂය සඳහා වූ ආදායම් නොවන ලැබීම් සහ වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම රු.113,171,795 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි මූල්‍ය ප්‍රකාශ සකස් කල යුතුය. | වර්ෂය සඳහා ආදායම් ලෙස මුදලින් ලද වටිනාකම පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් කරන ලද අතර ඉදිරි ගිණුම් වර්ෂය සඳහා හරස් සටහන් මගින් ලද වටිනාකම් ඇතුලත් වන ශේෂ පිරික්සුම අනුව වටිනාකම් ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| **(ආ)** වෙනත් ශීර්ෂ වෙනුවෙන්, සහනාධාර සහ මාරුකිරීම්, පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් සඳහා වැය කරන ලද වියදම් රු.79,426,330 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | - එම - | - එම - |

| | | |
|---|---|---|
| (ඈ) වර්ෂය සඳහා භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් වියදම් රු.3,100,499 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඇ ) වර්ෂය තුළ අත්තිකාරම් "බී" ගිණුම යටතේ අයකර ගැනීම් වටිනාකම රු.35,725,209 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. තවද එම ගෙවීම් වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව රු.50,977,977 ක් ද භාණ්ඩාගාර මුද්‍රිත අනුව රු.51,343,912 ක්ද වී තිබූ බැවින් එම සංඛ්‍යා අතර රු.365,935 ක වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | අත්තිකාරම් "බී" ගිණුම යටතේ වන ගෙවීම් හා අයකර ගැනීම් ලෙස වර්ෂය තුළ මුදලින් ගෙවීම් හා මුදලින් ලැබීම් වටිනාකම් පමණක් ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරන ලදී. ඉදිරි ගිණුම් වර්ෂය සඳහා හරස් සටහන් මඟින් කරන ලද ගෙවීම් හා ලැබීම් වටිනාකම්ද ඇතුලත් වන පරිදි ශේෂ පිරික්සුම අනුව වටිනාකම ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදී |
| (ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් සහ ගෙවීම් වටිනාකම් පිළිවෙලින් රු.1,903,911 ක් සහ රු.2,475,252 ක් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | වර්ෂය තුළ තැන්පතු ලැබීම් වල සහ තැන්පතු ගෙවීම් වල වටිනාකම් ලෙස මුදලින් ලැබීම් සහ ගෙවීම් වටිනාකම් පමණක් ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරන ලදී. ඉදිරි ගිණුම් වර්ෂය සඳහා හරස් සටහන් මඟින් කරන ලද ලැබීම් සහ ගෙවීම් වටිනාකම්ද ඇතුලත් වන ලෙස ශේෂ පිරික්සුම අනුව වටිනාකම ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදී. |

### 1.6.3. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වේ. | පිළිගනිමි.<br>ඇප තැබිය යුතු නිලධාරීන් දැනුවත් කර ඇප තැන්පත් කරවීමට හා ඇප තැබිය යුතු නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කිරීමට සටහන් කර ගන්නා ලදී |

**1.6.4 විගණන සාක්ෂි නොවීම**

**---------------------------**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සෑම විශ්‍රාමිකයකු සඳහාම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වාගෙන යායුතු වුවද නියැදි පරීක්ෂාවලදී හෙළිදරවු වූ පරිදි ප්‍රාදේශිය ලේකම් කාර්යාල 3 ක ගොනු නොමැතිව විශ්‍රාමිකයින් 60 දෙනෙක් සඳහාද, පරීක්ෂා මට්ටමේ පැවති තාවකාලික ගොනු සහිත විශ්‍රාමිකයන් 12 දෙනෙක් සඳහාද විශ්‍රාම වැටුප් ගෙවමින් පැවතුණි. | ගොනු නොමැති විශ්‍රාමිකයින් සඳහා තාවකාලික ගොනු සකස් කර කඩිනමින් අනුමත කල යුතු වන අතර තොරතුරු ඉදිරිපත් නොකරන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් නවතා දැමිය යුතු වේ. | තාවකාලික ගොනු සකස් කිරීමට තොරතුරු ඉල්ලා ඇති විශ්‍රාමිකයින් සංඛාව කොළඹ, ගඟවට කෝරළේ, කුරුණෑගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල **60** ක්ද, පරීක්ෂා මට්ටමේ පැවති තාවකාලික ගොනු සහිත විශ්‍රාමිකයන් සංඛ්‍යාව කොළඹ, කුරුණෑගල, යටිනුවර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 12 ක් ද වේ . |
| (ආ) | 2019 නොවැම්බර් මස දත්ත පද්ධතිය අනුව විදෙස් ගත එක් විශ්‍රාමිකයකු වෙත සිවිල් විශ්‍රාම වැටුප් 2 බැගින් ගෙවූ අවස්ථා 17 ක් නිරීක්ෂණය විය. 2021 ජනවාරි මාසය වන විට දත්ත පද්ධතියෙහි එම විශ්‍රාම වැටුප් 34 න් 13 ක වර්ග සංකේත වෙනස් කර තිබු අතර 12 ක ගෙවීම් නවතා දමා තිබුණි. එහෙත් පරීක්ෂාව සඳහා එයින් ලිපිගොණු 28 ක් ඉදිරිපත් නොවුණි. | එක් විශ්‍රාමිකයකු වෙත සිවිල් විශ්‍රාම වැටුප් එකකට වඩා ගෙවීම් සිදු නොවන පරිදි දත්ත පද්ධතියේ අභ්‍යන්තර පාලනය වැඩි දියුනු කළ යුතු අතර ගෙවීම් නවතා දැමූ විශ්‍රාම වැටුප්වල වැඩිපුර ගෙවීම් අයකර ගැනීම සිදුකල යුතු වේ. | විශ්‍රාම වැටුප් වර්ග සංකේත අංක දත්ත පද්ධතියෙහි නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය අනුව, 2014 දෙසැම්බර් සිට 2018 මැයි දක්වා එකම නමක් හා එකම බැංකු ගිණුම් අංකයක් සඳහා සිවිල් විශ්‍රාම වැටුප් දෙකක් ගෙවා තිබුණු අතර එයින් එක් ලිපිගොණුවක අත්‍යවශ්‍ය ලියවිලි කිසිවක් නොතිබුණි. තවද, වැඩිපුර ගෙවීමක් සිදුව ඇත්නම් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | ගෙවීම් සිදු කරන විශ්‍රාම වැටුප් ලිපි ගොණුවක විශ්‍රාම වැටුප් ඉල්ලුම් පත්‍රය, විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය, චරියා සටහන් වැනි ප්‍රධාන ලියවිලි අඩංගු විය යුතු වේ. වැඩිපුර ගෙවීම් සිදුව ඇත්නම් එය අයකර ගැනීමටද කටයුතු කල යුතු වේ. | අදාල විශ්‍රාම වැටුප් ලිපිගොනුව තාවකාලික ගොනුවක් වශයෙන් හඳුනාගත හැකි අතර විශ්‍රාමිකයා හට දැනුම් දීමකින් අදාළ තොරතුරු ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වියදම් දැරීමේ හා ආදායම් එකතු කිරීමේ බලය පැවරීම මුදල් රෙගුලාසි අනුව සිදු කර විගණකාධිපති වෙත දන්වා ඇති අතර විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය හා අභ්‍යන්තර පාලනය පිළිබඳ සමාලෝචනයන් සිදුකර වෙනස්වීම් සිදුකර ඇතත් විගණනයට දන්වා නොමැති බව පිළිගනිමි. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ **3.3** ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | - එම - | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගෙන් ද පිළිතුරු ලබාගෙන පිළිතුරු ලබා දිය යුතු බැවින් කාල පමාවක් පවතින බව පිළිගනිමි. |

## 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(ආ) | දෙනු ලබන අතුරු අග්‍රිම දෙන ලද කාර්ය නිමකල විගසම පියවිය යුතු වුවද අවස්ථා 03 කදී ලබාගෙන තිබූ රු. 142,000 ක් වූ අතුරු අග්‍රිම පියවීම සඳහා දින 09-52 ත් අතර කාල පරාසයක් ප්‍රමාද කර තිබූ බව නිරීක්ෂණය විය. | දෙනු ලබන අතුරු අග්‍රිම එය දෙන ලද කාර්ය නිමකල විගසම පියවා ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි.<br>අග්‍රිම නියමිත කාලය තුළ දී පියවීම කරන මෙන් සියළුම මාණ්ඩලික නිලධාරින් දැනුවත් කර ඇත. |
| (ආ) 2019 මැයි 30 දිනැති අංක 2/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 වන ඡේදය | ආණ්ඩුවෙන් විශ්‍රාම වැටුපක් ලබමින් සිටි පුද්ගලයෙකුගේ මරණයක් ලියාපදිංචි කල විට ඒ බව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්, අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත වාර්තා කර එම වාර්තාවේ පිටපතක් තමන් වෙත සතියකට වරක් එවන ලෙස අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් තම පාලනයේ කටයුතු කරන රෙජිස්ට්‍රාර්වරු හා වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන්ට උපදෙස් ලබාදිය යුතුව තිබුණි. එහෙත් නියැදි පරික්ෂාවකදී නාරම්මල, කුරුණෑගල, යටිනුවර, ගඟවටකෝරලය යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන ලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාල දැනුවත් කල යුතු වේ. | චක්‍රලේඛයෙහි අංක 4 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වන ලෙස කොට්ඨාශයට අයත් සියළුම රෙජිස්ටාර්වරුන් දැනුවත් කළ බව ප්‍රාදේශීය ලේකම්වරුන් දන්වා ඇත. |

(ඇ) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| (i) 2014 අප්‍රේල් 07 දිනැති අංක 01/2011 (සංශෝධන) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකම මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරිම සඳහා ක්‍රමවත් පාලන ගිණුමක් පවත්වාගෙන යාම අනිවාර්ය කර තිබේ. නියැදි පරික්ෂාවකට අනුව කොළඹ, පන්නල සහ නාරම්මල යන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් නිලධාරීන් විසින් එපරිදි පාලන ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකම විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සඳහා නිලධාරින් අනුයුක්තව සිටින බැවින් ක්‍රමවත් පාලන ගිණුමක් සකස් කර විශ්‍රාම වැටුප් වියදමේ නිවැරදිතාවය තහවුරු කළ යුතු වේ. | විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය මධ්‍යගත දත්ත පද්ධතියෙන් සිදු කරන බැවින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙනම පාලන ගිණුමක් පවත්වා ගෙන යෑම අපහසු වුවත් පාලන ගිණුම සැකසීම ප්‍රාදේශීය ලේකම්ගේ වගකීමකි. |
| (ii) 2018 ජුනි 19 දිනැති අංක 01/2018 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයෙහි 21 හා 29 ඡේද | සෑම වසරකම දෙසැම්බර් මස 01 දින සිට ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 දක්වා කාලය තුල සියලුම විදේශගත විශ්‍රාමිකයින් සිය ජීවිත සහතික ලබාදිය යුතු අතර එසේ කටයුතු නොකරන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම එම වර්ෂයේ මැයි මස සිට තාවකාලිකව නතර කළ යුතු වේ. කෙසේ වුවද, 2019 වර්ෂය සඳහා ජීවිත සහතික ඉදිරිපත් නොකළ විදේශ විශ්‍රාමිකයින් 5156 ක් සඳහා 2019 නොවැම්බර් මස දක්වා ගෙවීම් නතර කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගෙවීම් නතර කිරීමට කටයුතු කල යුතු වේ. | ගෙවීම් ක්‍රමවේදයන්හි දුර්වලතා හේතුවෙන් බැංකු ක්‍රමය මඟින් පමණක් ගෙවීමට 2018 අගෝස්තු මාසයේ තීරණය කරන ලදී. එසේ නතර කල විශ්‍රාම වැටුප් බැංකු ක්‍රමයට මාරු කිරීමේදී විරෝධතා හා විමසීම් සඳහා නිලධාරින් යෙදවීමට සිදු විය. 2019 වර්ෂයේ ජීවිත සහතික ලබා නොදුන් විදේශගත විශ්‍රාම වැටුප් 2020 වර්ෂයේ සිට නතර කිරීමට අපේක්ෂා කළද වසංගත තත්වය නිසා නතර නොකරන ලදී. |
| (iii) 2015 සැප්තැම්බර් 14 දිනැති අංක 09/2015 හා 2011 නොවැම්බර් 04 දිනැති දිනැති අංක 08/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක අවස්ථා 54 ක දී රු.2,028,101 ක වටිනාකමක් සහිත බාල වයස්කරුවන්ගේ පාස්පොත් ඔවුනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබියදීත් අදාල පුද්ගලයන් වෙත භාර දී නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රතිලාභ හිමිගැන්විය යුතු වේ. | කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලිපි තැපැල් කළද එක් අයෙකු පාස්පොත භාර ගත් බවත් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දෙදෙනෙකුට ලිපි තැපැල් කරද ඉතිරි දරුවන්ගේ තොරතුරු ග්‍රාම නිලධාරීන්ගෙන් ලබා ගැනීමටද කටයුතු යොදා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් සංකේත අංකය 20.04.01.00 (මධ්‍යම රජය) යටතේ සමාලෝචිත වර්ෂය තුළදී රු. 42,736,960 ක් ආදායමෙන් ආපසු ගෙවා තිබූ අතර එම ගෙවීම්වලින් රු. 41,310,201 ක් තහවුරු කර ගැනීම සඳහා 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) වගන්තිය ප්‍රකාරව අදාල ආයතනවලින් හර නිවේදන ලබා ගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව හර නිවේදන ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල ආයතනයන්ගෙන් හර නිවේදන ඉල්ලා යැවීම සහ . සිහි කැඳවීම් මඟින් දැනුවත් කිරීම සිදු කර ඇති අතර , වාර්තාවන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම එවීම හර කරනු ලබන ආයතනයේද වගකීමක් වේ. |
| (ආ) | ආදායම් සංකේත අංකය 20:04:01:00 (මධ්‍යම රජය) යටතේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු සඳහා දායක වී තිබෙන නිලධාරින් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනිමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිළිබඳ නිවැරදි තොරතුරු නොමැතිවීම හේතුවෙන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා හිමිකම් හා දායක මුදල් ආපසු ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමිගැන්වීමේදී දායක මුදල් නිශ්චිතව, අඛණ්ඩව ලැබුනේද යන්න දෙපාර්තමේන්තුව තුලින් තහවුරු කර ගැනිමට නොහැකි වී තිබුණි. | දායකයින් හා දායක ගෙවීම් පිළිබඳ දත්ත පද්ධතියක් සම්බන්ධිත ආයතනවල සහයෝගය ඇතිව විශ්රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගැනිමට පියවර ගත යුතු වේ. | සියලුම රාජ්‍ය නිලධාරින්ගේ දත්ත මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඇතුලත් කළ හැකි වැඩසටහනක් 2017 ඔක්තෝබර් මස සිට හඳුන්වා දී ඇතත් අනෙකුත් ආයතනයන්හි සහය නොමැති වීමෙන් ක්‍රියාත්මක කිරීම අකර්ණම්‍ය වී ඇත. අය කර ගැනීම් විස්තරයක් අවසානයට සේවය කල ආයතනයෙන් සහතික කිරීමෙන් පසුව විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙන්වා ගනු ලබන අතර ආපසු ගෙවීමේ දී නියමිත ප්‍රතිශතයට අදාලව අයකරගෙන ඇත්දැයි පරික්ෂා කරනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආදායම් සංකේත අංකය 20:04:02:00 යටතේ පළාත් සභාවල සමාජ සංරක්ෂණ දායක මුදල් ලැබීම් හා හිඟ දායක මුදල් ආයතන අනුව මෙන්ම දායකයන් අනුව, නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි සුදුසු දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි. පළාත් පාලන ආයතන විසින් වාර්තාකර තිබූ වට්නාකම් හිඟ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.808,293,002 ක් වූ හිඟ ආදායමේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමටද එම වට්නාකම් දායකයා අනුව වෙන්කර ගැනීමටද නොහැකි වි තිබුණි. | දායකයින් හා දයක ගෙවීම් පිලිබඳ දත්ත පද්ධතියක් පවත්වා ගෙන දායක මුදල් නිශ්චිතව ලැබුණේ දැයි තහවුරු කර ගැනීමට කටයුතු කල යුතු වේ. | සියලුම රාජ්‍ය නිලධාරින්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ වැඩසටහනක් 2017 ඔක්තෝබර් මාසයේ සිට හඳුන්වා දී ඇතත් අනෙකුත් ආයතනයන්හි සහය නොමැති වීමෙන් මන්දගාමී වී ඇත. බස්නාහිර පළාත් සභාව හැර අනෙකුත් පළාත් සභාවන්, දායක මුදල් ගිණුම් සාරාංශ ඔස්සේ එකතු කර චෙක්පතක් මගින් ප්‍රේෂණය කරනු ලැබේ. සියළු රාජ්‍ය ආයතනයන්ගෙන් වන ලැබීම් සහ හිඟ මුදල්වලට අදාල ලැබීම් ආදායම ලෙසත් පළාත් සභා හිඟ ආදායම් වාර්තා මත හිඟ ආදායමත් ගිණුම් ගත කරයි. |
| (ඈ) | 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියළුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන විට සෑම මාසයකම අයකිරීම් ඊළඟ මාසයේ 15 දිනට පෙර ගෙන්වා ගැනීමට කටයුතු කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා දින 14 සිට දින 94 දක්වා ප්‍රමාද වූ අවස්ථා නිරීක්ෂණය විය. | නියමිත දිනට දායක මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | දායක මුදල් වෙන් කරනුයේ වැටුප් ගෙවන විටදී බැවින් 20 වන දින දක්වා කල් ලබා දී ඇති අතර ප්‍රමාද වන අවස්ථාවල දුරකථන සහ ලිපි මඟින් මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් ලිපි මඟින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් කොමිෂන් සභාව වෙත ඔබ කාර්යාලයටද පිටපතක් සහිතව දැනුවත් කර ඇත. මුදල් නිසි පරිදි එවීම අනෙකුත් සියළු රාජ්‍ය ආයතනයන්හි වගකීම වේ. |
| (ඉ) | සෘජුවම චෙක්පත් මඟින් දායක මුදල් එවනු ලබන ආයතන 05 ක් විසින් ඉදිරිපත් කරන ලද රු. 756,996 ක් වූ චෙක්පත් 07 ක් විවිධ හේතු මත 2019 මැයි 24 සිට 2019 ඔක්තෝබර් 10 දක්වා ආපසු කාලය තුල හරවා යවා තිබුණි. එහෙත් 2021 ජනවාරි 14 වන විට වසරකට වැඩි කාලයක් ගත වී ඇතත් එම දායක මුදල් නැවත ලැබී නොතිබුණි. | ආපසු හරවා යවන ලද දායක මුදල් නැවත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. එම චෙක්පත් සම්බන්ධව අදාල ආයතන වෙතින් විමසීම් කළ ද පිළිතුරු ලැබී නොමැත. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 04 කට සහ මූලධන වැය විෂයයන් 06 කට අදාළව ඉතිරිවීම් පිළිවෙලින් රු.7,684,757 ක් හා රු.10,032,998 ක් වූ අතර එය එක් එක් වැය විෂයයන් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 91 දක්වා පරාසයක පැවතුණු බැවින් ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | පුනරාවර්තන වැය විෂයයන් 5 හි වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරිම තුළින් ද, මූලධන වැය විෂයන් 7ට අදාලව 2019/09/24 දිනැති ජාතික අයවැය චක්‍රලේක අංක 05/2019 අනුව 10% ක් අනිවාර්යයෙන් ඉතිරි කිරීම් තුලින්ද ඉතිරිවීම් සිදු වී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කර ගන්නා ලද රු.46,859,000 ක ප්‍රතිපාදනයන්ට අමතරව මු.රෙ 66/69 ප්‍රතිපාදන රු.16,365,000 ක් මාරු කර ගැනිමෙන් පසු එම වැය විෂයයන්වල රු.8,006,579 ක් එනම් මාරු කරගන්නා ලද මුදලින් සියයට 48 ක් වූ ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | ප්‍රාග්ධන වැය විෂයන් සඳහා මාරු කර ගත් ප්‍රතිපාදන ජාතික අයවැය චක්‍රලේඛ 5/2019 මඟින් වියදම් සීමා කිරීමෙන් ඉතිරි විය. 2–1508 වැය විෂය සඳහා මාරු කරගත් ප්‍රතිපාදන විශ්‍රාම වැටුප් සංශෝධන ගොනු සකස් නොවීම හේතුවෙන් සීමා විය. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කල රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට වැඩ තහනම් කර ඇති, සේවය අතහැර ගොස් ඇති හා ස්ථාන මාරු වී ගිය නිලධාරින් 12 දෙනෙකුගෙන් අයකර ගත යුතු වර්ෂ 5ට වැඩි කාලයක් හිඟ හිට පැවතින ශේෂය රු. 718,350 ක් වී තිබුණු අතර මෙම ශේෂ 2021 ජනවාරි 14 දක්වා නිරවුල් කරගෙන නොතිබුණි. | අයවීම් හිඟ හිට ඇති අත්තිකාරම් ශේෂ අය කර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි.<br>රු.45,639 ක් වූ නිලධාරීන්ගේ ණය ශේෂ පියවන ලෙස දැනුම් දීමට තොරතුරු නොමැති අතර රු.328,002 ක් වූ නිලධාරීන්ගේ විනය පරීක්ෂණ අවසන් වී නොමැත. රු.146,321 ක ණය ශේෂය පිලිබඳ නීතිපති විමසීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂය හා පාලන ගිණුම් ශේෂය අතර රු.315,738 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස තුල ඇතුළත් එකතුව රු.85,877 ක් වසර 7 කට වඩා පැරණි ශේෂ වූ අතර එම ශේෂ සමාලෝචිත වර්ෂය තුලදීද නිරවුල් කර නොතිබුණි . . | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ අනුව හා පාලන ගිණුම අතර වෙනස හඳුනාගෙන එය නිරවුල් කල යුතු වේ.. | එම රු 315,738 ක් වූ වෙනස තුළ රු.85,877 හි අදාළ නොවන ගෙවීම් රු.72,885 ක් හා අදාළ නොවන කාර්ය මණ්ඩල සඳහා ගෙවීම් රු.12,992 ක් ඇත. වගකිව යුතු නිලධාරීන් දෙදෙනෙකුගේ වර්තමාන සේවා ස්ථාන හඳුනා ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත විමසුම් ලිපි යොමු කිරීමටත්, අනෙක් නිලධාරිනිය සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලද තොරතුරු අනුව අවසන් වරට සේවය කළ ආයතනය වෙත විමසුම් ලිපි යොමු කිරීමටත් කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ---------------------------------------- |
| (අ) | මුල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 1 අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප්වලින් තවදුරටත් අයකර ගත යුතු මුදල රු.මිලියන 591 ක් වී තිබුණි. මෙම ශේෂය, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.මිලියන 8 කින් ද, වර්ෂ 5 - 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රු.මිලියන 37 කින්ද, වර්ෂ 5 ක අඩු කාලයක් තුල අයකරගත යුතු රු. මිලියන 546 කින් ද සමන්විත විය. | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අප්‍රමාදව අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. | එම වැඩිපුර ගෙවීම් වාරික ලෙස හා මුළු මුදල එකවර ලෙස අය කරනු ලබයි. අවශ්‍ය අවස්ථාවල මු.රෙ.104 පරික්ෂණ ද කර ඇත. වාරික ඔවුන් ලබන වෙනත් විශ්‍රාම වැටුප්, වයස, වැඩියෙන් ගෙවා ඇති වටිනාකම සහ ඉල්ලීම් යන කරුණු මත තීරණය වන බැවින් වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට කාල පමාවක් පවතී. |
| (ආ) | හානි හා පාඩු ලේඛනයේ 2018 දෙසැම්බර් 31 දිනට හා 2019 ජනවාරි 01 දිනට අවසන් හා ආරම්භක ශේෂ සැසඳීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 444 ක අයකරගතයුතු ශේෂවල වෙනස්කම් නිරීක්ෂණය විය. | පසුගිය වර්ෂයේ අවසාන ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය විය යුතු වේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එවන තොරතුරුවල වෙනස්කම් සඳහා ගැලපීම් කිරීම සහ විශ්‍රාම ගන්වනවිටදී පාරිතෝෂිකය ඉක්මවා රජයට අය විය යුතු මුදල්, විශ්‍රාම වැටුපෙන් අය කර ප්‍රේෂණය කරන අවස්ථාවලදී ,එම ශේෂයන් හානි හා පාඩු ලේඛණයේ දක්වා තිබීම නිවැරදි කළ නිසා මෙම වෙනස්කම ඇති විය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 ජුනි 11 දිනැති අංක 01/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගනු ලැබූ සියලු විශ්‍රාමිකයන් සඳහා 2019 ජූලි 01 දින විශ්‍රාම වැටුප් ගැලපීමත් සමඟ මෙතෙක් අයවැය යෝජනා අනුව මාසිකව ගෙවනු ලැබූ රු.3500 ක අන්තර් දීමනාව ගෙවීම නතර කල යුතු විය. එහෙත් ඊට පටහැනිව විශ්‍රාමිකයින් 214 දෙනකු සදහා වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප සමඟ ගෙවන යැපීම් දීමනාව සමග අන්තර් දීමනාව ගෙවීම හේතුවෙන් 2019 ජූලි 01 දින සිට 2020 දෙසැම්බර් දක්වා ආසන්න වශයෙන් රු.16,839,900 ක් වැඩිපුර ගෙවා තිබුණි. | විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් වැටුප් ගැලපීම කරන ලද විශ්‍රාමිකයන් සඳහා අන්තර් දීමනාව ගෙවීම සිදු නොවන පරිදි දත්ත පද්ධතියේ අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කල යුතු අතර විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවිම් සම්බන්ධව මුදල් රෙගුලාසි 103 හා 104 පරිදි ක්‍රියාකර අයකර ගත යුතු වේ. | ත්‍රිවිධ හමුදාවේ ආබාධිත හා මිය ගිය නිලධාරීන්ට දෙන වරප්‍රසාද සංශෝධනයට ලක්වීම තුල මෙවැනි ගැටළුකාරී තත්වයන් වරින් වර නිර්මාණය වී ඇත. තවද ඉදිරියේදී අදාල නිලධාරීන් විසින් කරනු ලබන ඉල්ලීම් හා ලබා දෙන විසඳුම් අනුව තවදුරටත් මෙය සංකීර්ණ විය හැකිය. මේ නිසා ත්‍රිවිධ හමුදාවන්ගේ වැටුප් හා දීමනා , විශ්‍රාම යාමේදී, දුබලතාවයට පත් වීමේදී, මිය යාමේදී ගෙවනු ලබන විශ්‍රාම වැටුප් හා දීමනා, ස්ථාවර මාසික දීමනා ආදිය නැවත සමාලෝචනය කර විසඳුමක් ලබා දීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදා හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නියෝජනයෙන් කමිටුවක් පත්කර නිර්දේශ ලබා දෙන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් 2020.12.15 දින ඉල්ලීමක් කර ඇත. |
| **(ඈ)** | 2011 මැයි 16 දිනැති අංක 04/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයට පටහැනිව 2007 සැප්තැම්බර් 05 දින විශ්‍රාම ලැබූ නිලධාරියකු වෙත, 2012 ජනවාරි සිට 2020 පෙබරවාරි මාසය දක්වා රු. 113,500 ක් වූද, 2014 නොවැම්බර් 03 දිනැති හා 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයට පටහැනිව 2014 නොවැම්බර් සිට 2019 මාර්තු මාසය දක්වා සේවා විශ්‍රාම වැටුප සහ දුබලතා විශ්‍රාම වැටුප සඳහා රු.180,500 ක් වූද , 2016 අප්‍රියල් 27 දිනැති 3/2016 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයට පටහැනිව සන්නද්ධ සේවා විශ්‍රාමික රණවිරුවන් පස් දෙනෙකුට ට දුබලතා විශ්‍රාම වැටුප සමඟ රු.486,500 ක් වූද , අන්තර් දීමනා ගෙවීම නිසා එකතුව රු.780,500 ක් වූ අන්තර් දීමනා වැඩි පුර ගෙවා තිබුණු බව ප්‍රාදේශිය ලේකම් කාර්යාල 2 ක නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය. | චක්‍රලේඛවලට අනුකූල වන පරිදි ගෙවිම් සිදුවන පරිදි දත්ත පද්ධතියේ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කල යුතු අතර විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවිම් සම්බන්ධව මුදල් රෙගුලාසි 103, 104 පරිදි ක්‍රියාකර වැඩිපුර ගෙවිම් අයකර ගත යුතුය. | වැඩිපුර ගෙවන ලද අන්තර් දීමනාව මාසිකව අය කිරීම සඳහා දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත. 2020 දෙසැම්බර් මස වන විට අය කිරීමට ඇති ඉතිරි මුදල, රු.647,540 ක් වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | නියැදි පරීක්ෂණයකදී හෙළිදරව් කර ගත් පරිදි නාරම්මල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් අවස්ථා 04 කදී වැරදි ගණනය කිරීම් මත වැඩිපුර ගෙවන ලද යැපුම් දීමනා , අන්තර් දීමනා , විශ්‍රාම වැටුප් හා නියමිත දිනට පූර්වයෙන් විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම නිසා වැඩිපුර ගෙවා තිබූ මුදල රු. 1,067,609 ක් වී තිබුණි. | දත්ත පද්ධතියේ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කල යුතු අතර විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධව මුදල් රෙගුලාසි 103 හා 104 පරිදි ක්‍රියාකර වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. | මාසිකව අය කිරීම සඳහා දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත. 2020 දෙසැම්බර් මස වන විට අය කිරීමට ඇති ඉතිරි මුදල රු. 966,253.00 කි. |
| (ඊ) | 2010 සැප්තැම්බර් 07 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 8/2010 හා 2014 ජනවාරි 10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/2014 හි 3 වන 04 වන වගන්තිවලට අනුව රජයේ විශ්‍රාම වැටුපක් ලබමින් ජීවන වියදම් දීමනාව සහිත රජයේ හා සංස්ථා, මණ්ඩල වැනි ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප සමඟ ජීවන වියදම් දීමනා නොගෙවිය යුතු වුවද නියැදි විගණන පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් මඟින් විශ්‍රාම වැටුප් ලබමින් ව්‍යවස්ථාපිත ආයතනවල රැකියාවල නියුතුව සිටි විශ්‍රාමිකයන් 19 ක් වෙත ජීවන වියදම් දීමනා ලෙස රු. 3,399,768 ක් වැඩිපුර ගෙවා තිබුණි. | -එම- | මාසිකව අය කිරීම සඳහා දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත 2020 . දෙසැම්බර් මස වන විට අය කිරීමට ඇති ඉතිරි මුදල රු.2,599,178 කි. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | -------------------------------- |
| (අ) | නියැදි පරීක්ෂණවලදී හෙළිදරව් කරගත් පරිදි, වාර්ෂිකව ජීවත් වීමේ සහතිකය නොමැති වීම හේතුවෙන් කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2018 වර්ෂය වෙනුවෙන් විශ්‍රාමිකයින් **66** දෙනකුගේ හා **2019** වෙනුවෙන් විශ්‍රාමිකයින් **78** දෙනකුගේද , ගෙවීම් නවතා තිබුණි. ඇතැම් විශ්‍රාමිකයින් මියගොස් තිබූ බව සහ වැඩිපුර ගෙවා ඇති වටිනාකම ගෙන්වා ගැනීමට බැංකු වෙත ලිපි | මියගොස් ඇති විශ්‍රාමිකයින් වෙත වැඩිපුර ගෙවීම් සිදුව තිබේ නම් අය කර ගත යුතුය. | නැවත ජීවිත සහතික ඉදිරිපත් කළ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කළ අතර මියගිය විශ්‍රාමිකයන්ගේ වැඩිපුර ගෙවීම් ගෙන්වා ගැනීමට බැංකු වෙත ලිපි යවා ඇති බවද, ඇතැම් විශ්‍රාමිකයන් විදේශගත වී ඇති බවද ග්‍රාම නිලධාරින් විසින් වාර්තා කළ බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | යවා ඇති බවද දක්වා තිබුණද මියගිය විශ්‍රාමිකයන් සංඛ්‍යාව සහ වැඩිපුර ගෙවා ඇති වටිනාකම හඳුනා ගෙන නොතිබුණි. | | |
| (ආ) | අංක 1-52361 සහ 21-30243 දරන සිවිල් සහ වැන්දඹු විශ්‍රාම වැටුප් දෙකකට හිමිකම් පෑ විදේශගත විශ්‍රාමික කාන්තාවක් මියයාමෙන් පසු 2019 අප්‍රේල් හා මැයි මාසයන් සඳහා රු.60,848 ක මුදලක් වැඩියෙන් ගෙවීම් කර තිබුණු අතර එම මුදල් ආපසු අය කර නොතිබුණි . | මියයාම් සිදු වූ වහාම වාර්තා කර ගත හැකි පරිදි වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතු අතර විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධව මුදල් රෙගුලාසි 103 හා 104 පරිදි ක්‍රියාකර අයකර ගත යුතු වේ. | 2019 මාර්තු මස මිය ගොස් ඇති අතර, එම රු.60,847 ක සම්පූර්ණ මුදල අය කර ගැනීම සඳහා මරණ සහතිකයේ පිටපතක් සහ ඉල්ලීමේ ලිපියක් බැංකු ශාඛාව වෙත යවා ඇත. |
| (ඇ) | ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අවකරණ වාර්ථා අනුව මියගිය විශ්‍රාමිකයින් 4 වෙනුවෙන් රු. 719,872 ක් වූ වැඩිපුර ගෙවීම් අයකරගත නොහැකිව පැවතුණි. | මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර වැඩිපුර ගෙවූ මුදල් අයකර ගත යුතු වේ. | එම මුදල අය කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරින් මගින් උරුමකරුවන් දැනුවත් කර ඇත |
| (ඈ ) | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ 2020 සැප්තැම්බර් මාසයේ ගෙවීම් දත්ත පද්ධතිය පරීක්ෂාවේදී හෙළිදරව් කරගත් පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකල ලිපිගොනු 3906 ක් විය. තවද, 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගනු ලැබූ සියලුම රාජ්‍ය නිලධාරින්ගේ විශ්‍රාම වැටුප්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 සහ 14/2019 අනුව ගැලපීම, 2019 ජූනි 11 දිනැති අංක 01/2019 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් 2019 ජූලි 01 දින සිට සිදු කල යුතුව තිබුණද ජාතික හැඳුනුම්පත් අංක නොමැති වීම, යුද්ධය හා වෙනත් හේතු නිසා ලිපිගොනු අස්ථානගත වීම, වැටුප් සම්බන්ධ ගැටළු වැනි හේතු නිසා 2021 ජනවාරි 13 දින වන විට නොකල ලිපි ගොනු සංඛ්‍යාව 39,373 ක් වී තිබුණි. | චක්‍රලේඛය විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | විශ්‍රාමිකයන් 479,415 කගේ විශ්‍රාම වැටුප් පරිවර්තනය කර ඇති අතර විශ්‍රාමිකයන් 39,373 පරිවර්තනය කර නොමැත. ලිපිගොනු වල විවිධ අඩුපාඩු පැවතීම නිසා එම ගැලපීම ප්‍රමාද වී ඇති බව නිරික්ෂණය කරමි. (ජාතික හැඳුනුම්පත් අංක නොමැති වීම, යුද්ධය හා වෙනත් හේතු නිසා ලිපිගොනු අස්ථානගත වීම, වැටුප් සම්බන්ධ ගැටළු) |
| (ඉ ) | දායක මුදල් ආපසු ගෙවීම් පිළිබඳ නියැදි පරීක්ෂාවකට අනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ දායක මුදල් රැස්කලද එක් එක් දායකයාගෙන් අයකරන සාමාජික මුදල් පිළිබඳ තොරතුරු නොපැවැත්වීම සහ අදාල ආයතනය වෙතින්ම තොරතුරු ගෙන්වා ගැනීමට සිදුව තිබුණි. එම නිසා දායක මුදල් අයකරගෙන ඇතත් විශ්‍රාම යන තුරු අංකයක් නොමැති බව නොදැනීම, ස්ථාන මාරු කර ඇති බැවින් වැටුප් ලේජර සොයාගත නොහැකි වීම, දායක මුදල් අයවීම් විස්තර සඳහන් ලේඛන දිරාපත් වී තිබීම, ආයතනයේ තොරතුරු අස්තනගත වී තිබීම, අඩුකරගන්නා ලද වැන්දඹු අනත්දරු දායක මුදල් විස්තර සේවය කල | වැන්දඹු අනත්දරු දායක මුදල් අයවීම් තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුලින් තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතු වේ. අයදුම්පත් ලද පසු අඩුපාඩු දන්වා යැවීමට අප්‍රමාදව කටයුතු කල යුතු වේ. | මාසික දායක මුදල් අයවීම් වාර්තා වෙන්ව පවත්වා ගෙන යාම සංකීර්ණ වේ. . එදිනෙදා ලැබෙන සම්පූර්ණ වූ ගොනු ගෙවීම් කිරීමත්, අඩුපාඩු දන්වා යැවූ ගොනු සඳහා පිළිතුරු එවීමට ආයතන දිගු කාලයක් ගැනීමත්, ගොනුව නිශ්චිතව සොයාගත නොහැකි වීමත් , ඇතැම් ආයතන වල විෂය පථය වෙනස් වීම, ස්ථාන මාරු වී යාම නිසා ගෙවීම් ප්‍රමාද වීම් දක්නට ලැබුණි. මේ වන විට සරළ ක්‍රමයක් හඳුන්වා දී ඇති බැවින් ගෙවීමේ කටයුතු කඩිනම් වී ඇත |

| | | | |
|---|---|---|---|
| | ආයතනය විසින් එවීම ප්‍රමාද වීම මෙන්ම නොඑවීම වැනි හේතු මත දායක මුදල් ආපසු ලබා ගැනීමට නොහැකි වූ අවස්ථාවන් 7 ක් නිරීක්ෂණය විය. අයදුම්පත් වල අඩුපාඩු දන්වා යැවීමට ප්‍රමාද වීම මත ගෙවීම් ප්‍රමාද වීම් 6 ක් පැවතුණි. එහි ප්‍රමාද කාලය මාස 04 ත් වසර 03 ත් අතර විය. | | |
| (ඊ) | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය අනුව විශ්‍රාම වැටුප් ලද දිනය සඳහන් නොවන අවස්ථාවන් 5454 ක්, පැවති බව නිරීක්ෂණය විය. තවද විශ්‍රාමිකයාගේ උපන් දිනය විශ්‍රාම වැටුප් ලද දිනය ලෙස සඳහන් වූ අවස්ථාවන් සහ විශ්‍රාමිකයාගේ උපන් දිනයට පසු දිනයක් විශ්‍රාම වැටුප් ලද දිනය ලෙස පැවති අවස්ථාවන් 130 ක් 2020 සැප්තැම්බර් මස වනවිට පැවති බවද නිරීක්ෂණය විය. | විශ්‍රාම වැටුප් ලිපිගොනු පරීක්ෂා කර විශ්‍රාම වැටුප් ලද දිනය දත්ත පද්ධතිය තුළ නිවැරදි කල යුතු වේ. | 2016.10.08 දින සිට විශ්‍රාම යන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් තොරතුරු,මධ්‍යම දත්ත පද්ධතියක් හරහාම ලබා ගැනීම සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේදී විශ්‍රාමිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංක , විශ්‍රාම ගිය දිනය ඇතුළු තොරතුරු නිවැරදි කිරීම මගින් බහුතරයකගේ තොරතුරු නිවැරදි වී ඇති අතර ඉදිරියේදී ඉතිරි තොරතුරු නිවැරදි කරනු ලැබේ. |

**3.3. විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 6 කට 2020 සැප්තැම්බර් 02 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 17,637,547 ක් විය. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට කඩිනමින් පිළිතුරු ලබා දිය යුතු වේ. | විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු දෙපාර්තමේන්තුව සම්බන්ධිත ආයතනයන් වෙතින් නිවැරදි කිරීමෙන් පසුව පිළිතුරු ලබා දිය යුතු බැවින් කාල පමාවක් පවතින බව පිළිගනිමි. |

**3.4 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් අංක 21-2012767 යටතේ විශ්‍රාම ලබමින් සිටි නිලධාරිනිය මියගිය පසු වැඩිපුර ගෙවන ලද මුදලින් අයකර නොගත් රු.86,756 ක මුදල 2020 ඔක්තෝබර් 25 දින එකවර | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි මිය යන විශ්‍රාමිකයන්ගේ තොරතුරු කඩිනමින් වාර්තා වනසේ වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතු අතරම මුදල් | ඉතිරි මුදල නොගෙවූ නිසා පොලිසියට පැමිණිලි කරන ලද අතර 2020 ඔක්තෝබර් 25 දින එම මුදල ගෙවන බවට එකඟ විය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවන බවට එකඟ වී ඇතත් එකී වැඩිපුර විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුව 2021 ජනවාරි 08 වන විට වසර 2 යි මාස 5 ක කාලයක් ගත වී තිබුණද අදාල වටිනාකම් සම්පූර්ණයෙන් අයකර ගෙන නොතිබුණි. | රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර අලාභය ද අයකර ගතයුතු වේ. | |
| (ආ) | 1991 ජනවාරි සිට ගහවට කෝරලේ, 2004 අගෝස්තු සිට හාරිස්පත්තුව සහ 2011 මාර්තු සිට කුණ්ඩසාලේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ජාතික හැඳුනුම්පත් අංක 503334208v යටතේ විශ්‍රාම වැටුප් ලබා ගෙන තිබුණු විශ්‍රාමිකයාගේ ලිපිගොනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරුකර තිබුණද, දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් 2004 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා ගහවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ද විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. දත්ත පද්ධතියේ පවතින තොරතුරු මත 2008 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා එසේ රු.2,184,885 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණද මෙම මුදල අයකර ගෙන නොතිබුණි. | ගොනුවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරු කරන අවස්ථාවකදී දත්ත පද්ධතිය යාවත්කාලීන වේ දැයි පරීක්ෂාවට ලක් වන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කල යුතු අතර මු.රෙ 103 හා 104 ප්‍රකාරව වැඩිපුර ගෙවූ මුදල ද අය කල යුතු වේ. | ගෙවන ලද ද්විත්ව විශ්‍රාම වැටුප සම්බන්ධ පරික්ෂණය සඳහා කමිටුවක් පත් කර ඇත. 104 පරික්ෂණයක් සිදු කර වැඩිපුර ගෙවූ මුදල රු.2,169,551 ලෙස තක්සේරු කර ඇත. |
| (ඇ) | අංක 01-603326 හා 21-500158 මගින් සිවිල් හා වැන්දඹු ලෙස විශ්‍රාම වැටුප් 02 ක් ලබමින් සිට 2012 මැයි 30 මිය ගිය විශ්‍රාමික නිලධාරිනියක් වෙත වැඩිපුර ගෙවා තිබුණු රු.2,696,303 ක් වූ විශ්‍රාම වැටුපෙන් 2020 සැප්තැම්බර් 18 වන විටත් අයකර ගෙන නොතිබුණු මුදල රු. 2,388,251 ක් වී තිබුණි. | මිය යන විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු ලබාගෙන දත්ත පද්ධතිය යාවත්කාලීන කරගත හැකි වනසේ වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතු වන අතර මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගත යුතු වේ. | මරණය වාර්තා නොවීම නිසා වැඩිපුර ගෙවීම සිදුවී ඇත. වංචාව කල පුද්ගලයා රු.308,052 ක් ගෙවා ඉතිරි මුදල ගෙවීම පැහැර හැරීම නිසා ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලයේ අංක 118/18 යටතේ පැමිණිල්ලක් ගොනු කර අංක 24/2019 යටතේ නඩු පවරා ඇත. |
| (ඈ) | අංක 01- 600772 යටතේ විශ්‍රාම වැටුප් ලබමින් සිට 2013 නොවැම්බර් 07 දින මියගිය නිලධාරිණියගේ බැංකු ගිණුමට මිය ගොස් මාස 29 ක කාලයක් දක්වා රු.582,423 ක් විශ්‍රාම වැටුප් ප්‍රේෂණය කර තිබුණි. එයින් රු.581,916 ක් ATM කාඩ්පතක් භාවිතා කර ඉවත් කර තිබූ නමුත් 2020 සැප්තැම්බර් 18 වන විටත් එම මුදල් අයකරගෙන නොතිබුණි. | මිය යන විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු ලබාගෙන දත්ත පද්ධතිය යාවත්කාලීන කරගත යුතු වන අතර මුදල් රෙගුලාසි 103, 104 ප්‍රකාරව කටයුතු කර සිදු වූ අලාභය අයකර ගතයුතු වේ. | වංචා කළ පුද්ගලයාට නීතිමය කටයුතු කිරීම සඳහා ගම්පහ විශේෂ අපරාධ ඒකකයේ අංක - 119/19 (FCID) යටතේ පැමිණිල්ලක් ගොනු කර අංක - B25/2019 යටතේ නඩු පැවරූ බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දත්ත පද්ධතිය අනුව විශ්‍රාම වැටුප් අංක 21-0-105353 දරන විශ්‍රාමිකයා ගේ දියණියගේ ජාතික හැඳුනුම්පත් අංකය යොදා විශ්‍රාමිකයා මිය ගොස් මාස 86 ක කාලයක් ගතවන තෙක් ඇයගේ දියණිය විසින් ලබාගෙන තිබුණු රු.1,562,470 කින් 2019 දෙසැම්බර් 31 දිනට රු.1,196,336 ක මුදලක් තවදුරත් අය කර ගැනීමට පැවතිණි. වැඩිපුර ගෙවීමට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් නීතිමය හෝ විනය ක්‍රියාමාර්ග මෙතෙක් ගෙන නොතිබුණි. | මිය යන විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු ලබාගෙන දත්ත පද්ධතිය යාවත්කාලීන වනසේ වැඩ පිළිවෙලක් සකස් කර ගතයුතු වන අතර මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර සිදු වූ අලාභය ද අයකර ගතයුතු වේ. | මාසිකව රු.20,000 බැගින් ගෙවමින් පවතින අතර 2020 දෙසැම්බර් මස වන විට අයවීමට ඇති ශේෂය රු.1,116,336 කි |
| (ඊ) | ගල්නෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හිමිකම් නොමැති වැන්දඹුවකගේ ගිණුමට රු.1,596,640 ක් බැර කර එම මුදල් විශ්‍රාම වැටුප් නිලධාරිනිය විසින් ලබා ගෙන තිබුණි. 2012 ඔක්තෝබර් 22 වනවිට රු.1,000,000 ක මුදලක් ආපසු ගෙවා තිබුණද රු.596,640 ක මුදල 2020 සැප්තැම්බර් 18 වන විට ත් අයකරගෙන නොතිබුණි. | වගකිව යුතු නිලධාරින් සම්බන්ධව විධිමත් විනය පියවර ගත යුතු වන අතර වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු වේ. | එම නිලධාරිනියට එරෙහිව විනය පරික්ෂණ පැවැත්වීම සඳහා 2020 සැප්තැම්බර් 30 දින කටයුතු ආරම්භ කර ඇති අතර මේ වන තෙක් නිලධාරිනිව රැකවරණ නිලධාරියාගේ අවසර පත්‍රය යොමු කර නැත. |
| (උ) | කුරුවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතයේ දත්ත වෙනස් කරමින් හිඟ විශ්‍රාම වැටුප් ලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටි ගණකාධිකාරීවරයා විසින් 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ඔහුගේ ගිණුමට බැර කර ගෙන තිබූ රු. 6,758,120 ක මුදල් 2020 සැප්තැම්බර් 18 වන විට අය කර නොතිබුණි | මුදල් රෙගුලාසි 103,104 ප්‍රකාරව වගකිවයුත්තන් ගෙන් සිදු වූ අලාභය අයකර ගතයුතු වේ. | එම ගණකාධිකාරිවරයා සේවයෙන් පහ කළ බව රත්නපුර දිස්ත්‍රික් ලේකම්ගේ අංකDSRT/DASH/HRM/10/6/3-3 සහ 2020.06.06 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

| විගණන නිරික්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතන සංග්‍රහය II පරිච්ජේදය 13.3 ජේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත් කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. එහෙත් තනතුරට පූර්ණ කාලීන නිලධාරියකු සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම නොපමාව කලයුතු වේ. පූර්ණ කාලීන නිලධාරියකු අවශ්‍ය නොවේ නම් දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිලධාරීන් | ආයතන සංග්‍රහය II පරිච්ජේදය 13.3 ජේදය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ස්ථිර පත් කිරීම් සඳහා සුදුසුකම් සහිත නිලධාරින් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර නොමැති බැවින් දැනට අනුයුක්තව ඇති නිලධාරින් පලපුරුද්ද හා ජ්‍යේෂ්ඨතාවය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත වැඩ බැලීම සඳහා පත් කර ඇත. පුරප්පාඩු සහිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ආසන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ |

අතර රාජකාරී බේදා දිය යුතු වුවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහනට අනුව ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්තව ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය කරනු ලබන විශ්‍රාම වැටුප් නිළධාරීන් 07 ක් සඳහා 2020 ජූනි 24 වනවිට වැඩබැලීම් පත්වීම් ලබාදී තිබුණි. එම තනතුරු වල වැඩ බැලීම කාලය මාස 08 සිට මාස 65 ක් දක්වා වී තිබුණි.

නිලධාරින් පත් කර ඇත . පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීමට 2020 පෙබරවාරි 28 දිනැති ලිපියෙන් ඉල්ලීම් කර ඇත.